# සූත්‍ර නාමය සහ සූත්‍රපිටකයේ නිර්මාණය පිළිබඳ විචාරකයන්ගේ මත

කොඩිප්පිලි මහතා

සූත්‍ර හෙවත් සුත්ත යන වචනය බුදුසමයටත් පෙර භාවිත වූවකි. ක්‍රි: පූ: 6 වැනි සියවස සූත්‍ර යුගය, ධර්මශාස්ත්‍රයුගය යන නම් වලින්ද හැඳින්විය හැකි බැව් ඉතිහාසඥ මතයයි. ගෘහ්‍යසූත්‍ර, ශ්‍රෞතසූත්‍ර, යන යන වෛදික ආගමික ඉගැන්වීම් ඇතුළත් ග්‍රන්ථවලටත්, වාත්ස්‍යායනගේ කාමසූත්‍ර වැනි ඉන් බාහිර විෂයයන් අළලා ලියැවුණු ග්‍රන්ථවලටත් සූත්‍ර නාමය යොදා තිබීමෙන් ම පෙර සිට සූත්‍ර නාමය භාවිත වූ බැව් පෙනේ. පාලියෙන් සුත්ත නමින් වූ මෙය ජෛන ප්‍රාකෘතයෙන් ''සුය'' නමින් සැළකේ. එබැවින් බ්‍රාහ්මණ, ජෛන, බෞද්ධ යන කොටස් තුනට ම සාධාරණ නාමයක්සේ සූත්‍ර යන්න භාවිත වූ බැව් සැළකිය හැකිය. මේ හැර වෛදික විසඳීම් අනුව ''සූක්ත'' හෙවත් යහපත් කීම් යන අර්ථයෙන් යුත් මැවුම් කරුගේ කටින් පිටවූ යහපත් වචන ඇතුළත් සූක්ත කොටසක් ද ඇත. පාලියෙහි එන සූත්‍ර නාමය ද එම වෛදික සූක්ත යන අර්ථයෙන් තැබුවකැයි සමහරු කියති. ශ්‍රී මුඛ දේශනාව යනුවෙන් ත්‍රිපිටකයේ ධර්මපර්‍යායයන් හඳුන්වන බැවින් එකී විග්‍රහය ද සැලකිය හැකි බැව් පෙනේ. ''පුරුෂ සූක්ත'' වැනි වෛදික සූක්තවල එනුයේ නිර්මාතෘ හෙවත් මැවුම් කරුගේ දේශනා කොටස්ය. තත්කාලීන බ්‍රාහ්මණ සමාජයේ තිබුණු කුලභේදය, පන්තිභේදය වැනි දේවල් පවා මේ සූක්තවල දක්නට ලැබේ.

මුල් බ්‍රාහ්මණ සූත්තවල ස්වරූපය අනුව එකී සූක්තයන් ''කෙටි අර්ථවත් වගන්ති-යක්'' යන අදහසට ගැළපෙන අයුරින් වර්තමාන විචාරකයෝ විග්‍රහ කෙරෙති. මෙ ''කෙටි අර්ථවත් වගන්තියක්'' යන අදහස අනුව සැළකුව ද ''සුත්ත'' නාමය පාලි යෙහි මුලදී භාවිතකර තිබෙන අරුතින් ගැළපෙන බැව් පෙනේ. පාලියෙහි, විනයනීතීන්හි දක්ෂතාවයක් ඇතිකර ගත යුතු යැයි පවසන තන්හි ''සුත්ත සො අනුබ්‍යඤ්ජනසො'' ආදි විසින් යෙදී ඇති බැව් පෙනේ. එවිට එකී විනය ප්‍රඥප්ති වල ද කෙටි අර්ථවත් ගද්‍ය වගන්තියෙකැ ස්වරූපය ඇති බැව් පෙනේ. නැතහොත් විනයප්‍රඥප්ති, ශික්ෂාපදඅනුප්‍රඥප්ති සඳහා ද ''සුත්ත'' යන නාමය යොදා ඇති බැව් පෙනේ. ඒ බව තව දුරටත් ''සුත්තවිභංග'' යන්නට එම නම තැබීමෙන්ම පෙනීයයි. ආපත්ති, අනාපත්ති ආදිය එක් එක් ශික්ෂා පදයන් සඳහා වෙන වෙන ම බෙදා ඇත. එබැවින් මුල දී බ්‍රාහ්මණයන් සුත්ත යන වචනය යොදා ගත් අර්ථයටම පාලියෙහි ද පාරාජිකා – සංඝාදිසෙස ආදියට යොදාගත් බැව් පෙනේ. මෙසේ පටන්ගත් මේ වචනය කල්යාමේ දී කෙටි නොවූත්, ගද්‍ය පමණක් නොවූත් විශාල අර්ථවත් පද්‍ය සහිත සූත්‍ර වලට ද යොදා ඇති බැව් සැළකිය හැකි ව ඇත. එහෙත් එ වැනි දේශනාවල ද එක්තරා

සැළැස්මක් දක්නට ඇත. සුත්ත සභාග වශයෙන් හෙවත් නූලක ස්වභාවයෙන්'' එකට සම්බන්ධකළ, ආදි, මජ්ඣ, පරියොසාන කල්‍යාණතාව අනුව එකට ඇඹරුණු හෙවත් ගෙතුණු සූත්‍ර සඳහා මේ සුත්ත නාමය යොදු තිබීම එකී ලක්ෂණය යි. මේ සුත්ත යන පදය ගද්‍ය පද්‍ය දෙකටම යොදු ඇත. රතන සූත්‍රය තනිකර පද්‍ය ය. එවැනි තනිකර පද්‍යමය සූත්‍ර තවත් රාශියෙකි. මේ අතර දීඝනිකායාදියෙහි එන බ්‍රහ්මජාල සූත්‍රවැනි තනිකර ගද්‍ය සූත්‍රද රාශියෙකි. මේ අනුව බලනවිට ගද්‍ය ද, පද්‍ය ද, ඒ දෙකින් මිශ්‍රද වූ විශාල සූත්‍ර වලට ද සුත්ත නාමය යොදු ඇති බැව් පෙනේ.

උදන පාළියෙහි අටුවාකරු, සොමනස්සඤාණමයික වූ අසූ දෙකක් සූත්‍ර ඇතැයි කියයි. උදනපාළිය බුදුන්ගේ ශ්‍රී මුඛදේශනාවේ ද ප්‍රීතිවාක්‍ය කොටස යි. උදන වාක්‍යවලට ද සුත්ත යන නාමය යොදු තිබීමෙන් පෙර කී සුඋක්ත හෙවත් යහපත් කීම් යන අර්ථය ද දිය හැකි ව ඇත. අටුවා යුගයේදී (ක්‍රි: ව: 5 සියවසේ දී පමණ) බුදුගොස් මාහිමියන් විසින් සුත්ත යන නාමය සඳහා අර්ථ රැසෙක් ඉදිරිපත් කෙරිණ.

''අත්ථානං සූචනතො, සුවුත්තතො
සවනතො ච, සූදනතො,
සුත්තානාසුත්තසභාගතො ච සුත්තං
සුත්තන්ති අක්ඛාතං''

යනුවෙන් ලෞකික ලොකෝත්තර අර්ථයන් අනුව ස්වාර්ථ පරාර්ථයන් පවසන යහපත් කීම් බැවින් ද මනාකොට වදළ අර්ථයන් ඇති බැවින් ද, දෙනකගෙන් ''කිරිවැගිරෙන්නාක් මෙන් අර්ථයන් වගුරුවන බැවින් ද, ස්වාර්ථ පරාර්ථයන් ආරක්ෂා කරන බැවින් ද, හුයක හෙවත් නූලක ස්වභාවය දරණ බැවින් ද ශස්‍යයෙන් ඵල ලැබෙන්නාක් මෙන් අර්ථයන් මතුකරන හෙවත් ප්‍රසව කරන බැවින් ද සුත්ත නමැයි කිවහැකි බැව් ප්‍රකාශ කෙරේ.

මෙසේ තෝරන අටුවාකරු, නවාංග ශාස්තෘශාසනයට අයත් සුත්තගෙය්‍යාදියෙහි දී සුත්ත යන අංගයට සම්පූර්ණ විනයපිටකයත් (උභතො විභංග, ඛන්ධක, පරිවාර) නිද්දෙස, සුත්ත නිපාත, මංගල, රතන, නාලක, තුවටක යන සූත්‍රත් ඇතුළත් කරන බැවින් සුත්ත නාමය මේ වනවිට කෙතරම් දුරට පළල් අර්ථයන් සඳහා යොදු ඇතිදැයි පෙනේ. එසේ නැතහොත් සුත්ත නාමය අසවල් දෙය සඳහායැයි නියමිත ව, සීමිත ව, ඊට කලින් නො තිබුණ බැව් හෝ පෙනේ. ඒ හැරුණු විට එකී බෙදීම අනුව නවාංග ශාස්තෘශාසනයේ අංග වෙන් කිරීම ද අටුවා ඇදුරන් අතින් ම සිදුවූවක් බැව් ද වටහා ගතහැකිවෙයි.

කෙසේ වෙතත් අද ප්‍රකට ව ඇති සූත්‍ර පිටක නමින් ගැනෙන ධර්මපර්‍ය්‍යායයන් පෙර කී නවාංග ශාස්තෘශාසනයේ සුත්ත යන නමට වඩා, සීමිත ධර්මකොටසක් සඳහා යෙදෙන බැව් ද පෙනේ. එද සුත්ත නමින් ගත් කොටසේ තිබුණු විනයප්‍රඥප්තීන් ඇතුළත් කොටස් අද වෙනම ම විනයපිටකය නමින් ගැනේ. එසේම නිද්දෙස, සුත්තනිපාත දෙක ඇතුළත් ඛුද්දකනිකාය පවා සූත්‍රපිටකයෙහි ලා සැලකීමට අද උගතුන් මැලිවන බැව් ද පෙනේ. ඒ සඳහා නිදසුන් දැක්වීමට පළමු දැනට අප අතර සූත්‍රපිටක නාමයෙන් අදහස් කරන කොටස් ගැන බෙදීම් ක්‍රමය සැළකිය යුතු ව ඇත. අද භාවිතවන සූත්‍රපිටකයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුක්තනිකාය අංගුත්තර නිකාය හා ඛුද්දක නිකාය, යැයි නිකාය නාමයෙන් හැඳින්වෙන පොත් කොටස් 5 ක් ඇතුළත් වේ. මෙහි දී ''පඤ්ච නිකාය'' යන නාමය ද අපට මුලින් ම දක්නට ලැබනුයේ අශෝකගේ සාංචිස්තූප අසල පුරාවස්තූන් අතර තිබුණු මැටිපුවරුවක සඳහන් ''පචනෙකයික'' යන ප්‍රාකෘතපදයක් වශයෙනි. එම ස්තූපයට පූජාවස්තූන් පිදූ අය කවුරුන් ද යන විස්තර දැක්වීමෙහි දී

මෙම නම භාවිත කොට ඇත. පංචනිකාය පිළිබඳ ඉගෙනුමක් ලැබූ භික්ෂුවක් එනමින් හඳුන්වන්නට ඇති බවත් එම වචනය පාළි ''පංච නිකායික'' යන වචනය අනුව යෙදුණක් බවත් විචාරකමතයෙකි. කෙසේ වෙතත් මුලදී නිකාය නාමයෙන් සූත්‍ර පිටකයේ පොත් හැඳින් වූ බවක් නො පෙනේ. එසේම ''සූත්‍ර පිටක, යන නාමයද මුල දී නොයෙදුණ බැව් ද පෙනේ. මුල දී යෙදුණේ ආගමපිටක යන නම බැව්:-

දීපවංසයේ ප්‍රථමසංගීතිවිස්තරයේ දී, ''ආගම පිටකං නාම, අකංසු සුත්තසම්මතං'' යන්නෙන් ද, මිලින්ද පඤ්හයෙහි ද, ඒ සඳහා (අංගුත්තරා ගම) ''ආගම යන නම ම, යෙදූ බැවින් ද, ත්‍රිපිටක සූත්‍රවල පවා සූත්‍ර පිටක ධාරීන් සඳහා ''ආගතාගමා'' යනුවෙන් යොද ඇති බැවින් ද, සර්‍වාස්තිවාදීන් පවා 'දීර්ඝා ගම මධ්‍යාමාගම එකෝත්තරා ගම' යනුවෙන් ත්‍රිපිටකයේ සූත්‍රපිටක පොත් සඳහා යොද ඇති බැවින් ද නිගමනය කළ හැකිය.

ආගම, නාමයෙන් ගැනෙන මේ සූත්‍ර පිටකාගත නිකාය පහේ සූත්‍රයන් සංග්‍රහ කොට ඇති පිළිවෙළ කවර සම්ප්‍රදයක් උඩ සිදුවී ඇති දැයි විමසීමේ දී පළමුවෙන් ම දීඝනිකාය නාමය හා එහි ධර්‍මපර්‍යායයන් පිළිබඳව සැළකිය යුතු ව ඇත. දීඝනිකාය යන්නෙහි තේරුම, දික්වූ සූත්‍ර එක්රැස් කිරීම යනු'යි. දීඝ නිකාය දික් සඟිය යනුවෙන් ද හඳුන්වනු ලැබේ. සඟි ශබ්දය පාළි සංගීති ශබ්දයෙන් ආවකි. දීඝනිකායාදී හතර සංගීති නාමයෙන් ද හඳුන්වන බැව් දීඝනිකාය අටුවාවෙන් (සුමංගලවිලාසිනී බාහිර නිදාන කථා) ද පෙනේ. එහි දීඝනිකායාදී හතර ගැන ''චතස්සො සංගීතියො, යි සඳහන් වේ.

දික්වූ සූත්‍ර එක්තැන් කොට සංග්‍රහ කරන ලදැයි ද එහි නම එබැවින් ම දීඝ නිකාය නම්වූ බැව් ද අටුවා අනුව පෙනේ. එහෙත් එකී නම සාමාන්‍ය පොදු, බහුල, ලක්ෂණයක් සලකා මිස දික්වූ සියලු ම සූත්‍ර එක්තැන් වූවක් සඳහා නොවන බැව් දීඝනිකායේ සූත්‍ර පමණට ම දික්වූ හා ඊටත් වඩා දික්වූ සූත්‍ර මජ්ඣිමනිකායෙහි ද තිබීමෙන් පෙනී යයි. එසේ නම් මේ නිකායන්ට සූත්‍ර ඇතුළත් කිරීමේ යම් කිසි ක්‍රමයක් තිබිය යුතු ය. එහෙත් එවැනි ක්‍රමයක් අනුව සූත්‍ර ඇතුළත් විණැයි ද කිව නො හැකිය. සූත්‍රසංඛ්‍යාව අතින් එක්තරා පිළිවෙළක් ඇත්දැයි සෙවීමේ දී වුව ද එවැනි පිළිවෙළක් පිළිබඳව ද කිව නො හැකිබැව් පෙනේ. දීඝනිකායේ සූත්‍ර 34 කි. බණවර 64 කි. බණවරක් නම් අකුරු අටදහසෙකි. ඒ අනුව දීඝනිකායේ අකුරු ගණන පන්ලක්ෂ දෙළොස් දහසෙකි. බණවර හා සූත්‍ර ද අක්ෂරසංඛ්‍යාව ද අනුව දීඝනිකායට මුල්තැන දිනැයි සැළකිය නො හැක්කේ මජ්ඣිම නිකායේ ඒ අංග තුනින් ම සීමාව ඉක්මවා යාම නිසයි. මජ්ඣිම නිකායේ සූත්‍ර 152 කි. බණවර අසූවෙකි. එවිට අක්ෂර සංඛ්‍යාවද විශාලත්වයට යේ. තවද කොටස් කිරීම අතින් ද දීඝනිකායේ සූත්‍ර කොටස් කිරීමෙහි පිළිවෙළක් කිව නො හැකිය. පෙරකී සූත්‍ර 34 වග්ග තුනකට වෙන් කොට ඇත. සීලක්ඛන්ධවග්ග, මහාවග්ග, පාටිකවග්ග යනුවෙනි. එහි සීලක්ඛන්ධවග්ගයට සූත්‍ර 13 ක්ද, මහාවග්ගයට සූත්‍ර 10 ක්ද, පාථික වග්ගයට සූත්‍ර 11 ක්ද, කොටස් කර ඇත. මේ අනුව බලන විට සූත්‍රවල ක්‍රමික වර්ධනයක් ඉහළට හෝ පහළට බැස්මක් අවරෝහණ ක්‍රමයට හෝ නැති බැව් පෙනේ.'' මෙවැනි ලක්ෂණයක් ඍග්වේද මණ්ඩලවල සමහරවිට දක්නට ඇතැයිද යනු අපර දිග විචාරකයකුගේ මතය යි.

ඍග්වේදයෙහි එකී පිළිවෙළ නම්, පළමු ව වැඩි සංඛ්‍යාවකුත් දෙවනු ව අඩු සංඛ්‍යාවකුත් තෙවැනි ව ඊට තරමක් වැඩි සංඛ්‍යාවකුත් යනාදී පිළිවෙළට බැව් ඔහුගේ කීම අනුව පෙනේ. දීඝනිකායේ සූත්‍රසංඛ්‍යාව එබඳු

ක්‍රමයකට වී නම් මජ්ඣිමනිකායේ ද අනෙක් නිකායවල ද එබන්දක් තිබියයුතු ය. මජ්ඣිමනිකායේ සූත්‍ර 152 කි. වග්ග පහකි. පිළිවෙළින් එන එකී වර්ගයන් පහ බැගින් එක්කොට ''පණ්ණාසක'' යන නම තබා, එවැනි පණ්ණාසක තුනක් වෙන්කොට ඇත. එහි මූල, මජ්ඣිම පණ්ණාසක දෙක්හි සූත්‍ර 10 බැගින් වූ වර්ග දහයෙකි. සූත්‍ර සංඛ්‍යාව ද ඒ දෙක්හි දහය බැගින් ම වේ. එහෙත් උපරිපණ්ණාසකයේ ද, මුල්වර්ග තුන සූත්‍ර 10 බැගින් ගෙනෙන අතර සිවුවැනි වර්ගයේ සූත්‍ර 12 කි. පස්වැනි වර්ගයේ යළිත් සූත්‍ර 10 කි. එවිට පෙරකී ආරෝහන අවරෝහන ක්‍රමය ද පිළිවෙළක් අනුව කළ එකක් නො වේ. මී ළඟට දීඝනිකාය ''ජනප්‍රිය ලක්ෂණයක්'' අනුව එක් කළැයි ද කිව නොහැකි ය. දීඝනිකායේ මුල් සූත්‍රයවූ බ්‍රහ්මජාලයේ අවසානයෙහි ''අභිනන්දිංසු'' යැයි එන අතර එම ලක්ෂණය මජ්ඣිම-නිකායේ මුල් සූත්‍රයේ අවසානයේ නැත. මූලපරියාය සූත්‍රාවසානයේ එනුයේ ''අනභි-නන්දිංසු'' යනුවෙන් නොසතුටු වූ බවයි. මී ළඟට අන්තර්ගත කරුණු අනුව විමසීමේ දී වුවද එහි යම්කිසි පිළිවෙළක් දක්නට නො ලැබේ. ප්‍රථම බ්‍රහ්මජාලසූත්‍රය පර සමය වාදයන් මැඩීමට දේශනා කළ එකකි. ඒ සූත්‍රයට, අනුත්තරසංගාමවිජය (ශ්‍රේෂ්ඨවූ ජයගැන්ම) යැයි ද අපර නාමයෙකි. මේ සූත්‍රයෙන් දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීන් ඛණ්ඩනය කිරීමට මුල් තැනදී ඇති අතර ඊට පළමුව, සීලක්ඛන්ධවග්ගයට අයත් බැවින්දෝ චූල සීල, මජ්ඣිමසීල, මහාසීල යනුවෙන් සිල් කොටස් තුනක් දක්වා ඇත. බුදුදහමේ ආර්‍ය්‍ය මාර්ගයෙහි යාමට ප්‍රධාන අංගත්‍රයෙකි. සීල, සමාධි, ප්‍රඥා, යන තුන. ඒ අනුව බලතහොත් චූල සීලයෙන් සීලයත්, මජ්ඣිම සීලයෙන් සමාධියත්, මහා සීලයෙන්, ප්‍රඥාවත්, පැවසෙන බවක් දක්නට ඇත. එබැවින් සූත්‍රපිටකයේ මුල් වර්ගය සීලක්-ඛන්ධ වර්ගය යැයි නම් කිරීමේ එක්තරා යුක්තියක් පෙනේ. එයිනුදු ''ශ්‍රේෂ්ඨ ජය ගැනීම'' (කෙලෙසුන්ගෙන් හෝ අන්‍ය වාදයන්ගෙන් හෝ) සඳහන් බ්‍රහ්මජාලසූත්‍රය මුලට සඳහන් කිරීමේ දී යුක්තියක් දක්නට ඇත. මෙකී ලක්ෂණ දෙකින්, සීලය පිළිබඳ ව එන විස්තරය මුළු සීලක්ඛන්ධ වර්ගයේ සූත්‍ර 13 හිම එතත් පරවාදමථනය සියලු සූත්‍රයන්හි ම නො පෙනේ. එවිට එක් අංශයකින් හෝ නිර්මාණය ගැන සැලකිල්ලක් දක්විණැයි ටිකකට වුවද සැළකිය හැකි ය. එසේ වුවද සීලක්ඛන්ධ වර්ගයේ එන සූත්‍ර 13 හිම එනුයේ එකම චූල, මධ්‍යම, මහාසීල ක්‍රමය යි. එබැවින් එම සූත්‍ර 13 හිම සීලත්‍රය එකම පෙය්‍යාලම-කින් කෙටිකළ හැකි වෙයි. එවිට පෙර කී දීඝනිකාය (දීඝ සූත්‍ර සංග්‍රහය) යන නාමයට නො ගැළපෙන බැව් පෙනේ.

තවද සීලක්ඛන්ධ වර්ගයෙහි එක් වැනි ම සූත්‍ර ද දක්නට ඇත. එවැනි දෙකකි. මහාලි, ජාලිය සූත්‍රද්වය. මහාලි සූත්‍රයෙහි දී මහාලි ලිච්ඡවි කුමරුන් විසින් ''කිනම් අවබෝධයක් සලකා භික්ෂුවක් මහණදම් රකී දැයි'' විමසූ ප්‍රශ්නයට සීලාදී පිළිවෙළින් ප්‍රතිපත්ති පුරා රහත්වූ විට ඊට පිළිතුරු ලැබෙන බවත්, ප්‍රකාශිත අතර, අනතුරුව ලිච්ඡවි කුමරුන් විසින් ජීවයත්, ශරීරයත්, එකක්ම ද යි'' විමසූ ප්‍රශ්නයන්ට එවැනි ප්‍රශ්න රහත්වූ කෙනෙකුන් විසින් නො ඇසියයුතු යැයි තමා සිතන බව දෙසමින්, එයම පිළිතුරු ලෙස දුන් බවත්, පෙනේ. ජාලිය සූත්‍රයෙහි ද මේ ප්‍රශ්න ම මේ පිළිතුරු ම පෙනේ. එබැවින් ඒ සූත්‍ර දෙකම එකක් ලෙස වුවද පහසුවෙන් එක්කළ හැකි ය. එවිට පෙර කී සූත්‍ර සංඛ්‍යාවෙහි ද වෙනසක් හෙවත් අඩුවක් පෙනේ. මේ වර්ගයේ සූත්‍ර සාරය අතින්ද සමානත්වයක් පෙනෙතත් හැම සූත්‍රයක ම එය ද දක්නට නැත.

මේ හැරුණු විට කරුණු අතින් ඒකීයත්-වයක්, ක්‍රමයක්, හෝ දීඝනිකාය මුලට

දැමීමට හේතුවක්, හෝ නො පෙනේ. දීඝ නිකායේ මහා වර්ගයේ සූත්‍ර දහයෙකි. මෙහි සූත්‍රවල දීඝ ලක්ෂණය පෙනේ. පොතේ ඇති වැඩිම දිග සූත්‍ර යි. මහා වග්ගයට නම් එම නම දීම පිළිබඳ ව තරමක ගැළපීමක් පෙනේ. "මහා යන්නෙන්"[6] සූත්‍ර ඇරඹෙන බැවින් හා සූත්‍රවල විශාලත්වය ද අනුව යි. එහෙත් මෙහි සූත්‍ර දහයෙහිම "මහා" විශෙෂණය නැත. "මහා" යන්නෙන් ඇරඹෙන සූත්‍ර 7 කි. මහා පදන, මහා නිදන, මහා සමය, මහා සතිපට්ඨාන, මහාපරි නිබ්බාණ, මහාසුදස්සන, මහා ගොවින්ද, යන ක්‍රමයෙනි. මහා විශෙෂණය නැති ව ජනවසභ, සක්ක පඤ්හ, පායාසි, යනුවෙන් සූත්‍ර තුනෙකි. මෙහි සූත්‍ර දිග්වීම ගැන විමසිලි මත් වූ විචාරකයෝ, මහා පරිනිබ්බාණ සූත්‍රය වැනි සූත්‍ර "එක් වකවානුවක දී නො ව, වරින් වර එකතු වූ කොටස් නිසා" දිග් වූ බව කියති. "වින්ටනිට්ස්" හා "ස්මිත්" මහත්වරු ද ඒ බැව් පිළි ගනිති. එහෙත් මෙහි අනෙක් සූත්‍ර ද එබඳු යැයි කීම වැඩි දෙනෙකුන් නො පිළි ගනු ඇත.

මෙහි එන මහා සුදස්සන සූත්‍රය අලංකාරොක්තියට බර වූ සෞභාග්‍ය වර්ණණයක් බැවින් කවියෙකුගේ සංකල්පනාවක් යැයි පෙනෙන බැවින් ද, මහා සමය සූත්‍රය දේවනාම ලැයිස්තුවක් පමණක් බැවින් සංගායනා තුනට ද පසු දේවභක්තික කෙනෙකුන් විසින් "එක් කරන ලද්දක් යැයි පෙනෙන බැවින් ද, මේ සූත්‍රයේ ඇතුළත" ධර්ම කොටස් ඇති තවත් මහා සමය සූත්‍රයක් සංයුක්ත නිකායේ සගාථකවග්ගයේ ඇතුළත් බැවින් ද, මහා සතිපට්ඨාන සූත්‍රයේ ධර්ම කොටස් ම ඇතුළත්, තවත් සතිපට්ඨාන සූත්‍රයක් මැදුම්සඟියේ ද, සතිපට්ඨාන විභංගයක් අභිධර්මයෙහි ද සතිපට්ඨාන සංයුක්තයක් සංයුක්ත නිකායේ ද ඇතුළත් බැවින් ද, මේ සූත්‍ර වරින්වර එකතු වූ ඒවා ලෙස විචාරකයින් ගේ පිළිගැණීමයි. කෙසේ වෙතත් මෙහි සූත්‍ර එක් වී ඇති පිළිවෙළෙහි නම් ගැළපීමක් ඇති බැව් පෙනේ. නැත හොත් මහා වග්ග නාමයට ගැළපීමක් දක්නා ලැබේ

පාථික වර්ගයේ සූත්‍ර 11 කි. මේ වර්ගයට නම යොද ඇත්තේ සීලක්ඛන්ධ – මහා වග්ග දෙක්හි ක්‍රමයට නො වේ. මෙහි නම යොද ඇත්තේ එහි මුල් සූත්‍රය දෙස බලා ඒ අනුව ය. මුලට එනුයේ පාථික සූත්‍රය බැවිනි. මේ කොටසේ සැලකිය යුතු සූත්‍ර කීපයෙකි. විමසීමට භාජනය වූ එකී සූත්‍ර පිළිබඳ ව විවිධ මතභේද දක්නට ඇත. අග්ගඤ්ඤ සූත්‍රය ලෝකයේ මුල පිළිබඳ විස්තරයෙකි. මෙය බුදුන් නො දෙසූ බැව් ද මතයෙකි. ආටානාටිය සූත්‍රය දෙවිවරුන් පිළිබඳ විස්තරයෙකි. සංගීති සූත්‍රය, සැරියුත් හිමියන් විසින් බුදුන් පිරිනිවීමට ළං වූ සමයෙකදී දෙසූවකි. "දසුත්තර" සූත්‍රය ද සැරියුත් හිමියන් චම්පාවේදී දෙසුවකි. මේ සූත්‍රය අංගුත්තර නිකායේ මෙන් එක දෙක ආදී පිළිවෙළ අනුව දහය දක්වා එන ධර්ම කරුණු එක්කොට විස්තර කෙරෙන්නකි.

දීඝනිකාය පිළිබඳව විචාරකයන්ගේ නිගමන රැසක්වෙයි. සීලක්ඛන්ධ වග්ග සූත්‍රවල ආදීම ලක්ෂණ ඇතැයි ද, පාථික වග්ග සූත්‍රවල මෑත කාලීන ලක්ෂණ ඇතැයි ද, කියති. මහාවග්ග සූත්‍රවල මහා පදය යෙදුණු ඒවා යනුවෙන් භාෂාව අතින් ද විවිධත්වයක් ඇත. මේ අනුව එක් තැනකදී කරුණු අනුවද, එක් තැනක දී ස්වභාවය අනුව ද, අනෙක් තැනක දී සංඥානාමයක් අනුව ද, නම් තැබීමේ පිළිවෙළක් හා ගද්‍ය පද්‍ය දෙක්හි විසමතාවක් ද සළකා දීඝනිකායේ නිර්මාණය පිළිබඳව "විවිධත්වයක්" දක්නට අතැයි විචාරකයෝ කියති.

2. මජ්ඣිම නිකායේ ද එබඳු විවිධත්වයක් පෙනෙන බැවින් එහි ද නිර්මාණය අතින් සකස් වීමක් උඩ නම් තැබීමක්, පෙන්විය නො හැකිය. මෙහිදු විෂය කරුණු අතින්

විවිධත්වයක් ඇත. ඉතිහාසය අතින් සැළකීමේ දී බුදුන් පිරිනිවීමෙන් පසු දෙසූ සූත්‍ර ද කීපයක් ඇත. බක්කුල සූත්‍රය දෙවැනි සංගීතියේ දී ඇතුළත් වූවකි. ගොපක මොග්ගල්ලාන සූත්‍ර දෙක ද පරිනිර්වාණයෙන් පසුව දෙසූ ඒවා ය. දිග අනුව මජ්ඣිම ප්‍රමාණයේ ලක්ෂණය අතින් නම නො ගැළපුණ ද, සූත්‍ර සංඛ්‍යාව අතින් මධ්‍යම ප්‍රමාණයක් ඇති බැවින් එක් අංශයකින් ගැළපීමක් පෙන්විය හැකි ය. දීඝ නිකායේ 34 ක, කුඩා සංඛ්‍යාවකි. සංයුක්ත නිකායේ 7760 කි. අංගුත්තර නිකායේ 9557 කි. ඒ අනුව මජ්ඣිම නිකායේ කුඩාත් නොවූ 152 ක ප්‍රමාණයක් පෙනෙන බැවිනි. මෙහි දී එක් එක් වකවානුවල දී තව තවත් සූත්‍ර එකතු වීමට ඉඩ තබා මේ පොත්හි වර්ගවල සූත්‍ර සංඛ්‍යාව සමානත්වයකින් තබන ලදැයි ද විචාරක මතයෙකි. මජ්ඣිම නිකායේ උපරිපණ්ණාසකයේ මුල්වර්ගවල සූත්‍ර 10 බැගිනුත් සිව්වැන්නේ 12 කුත් වූයේ, තව සූත්‍ර එක්වූ විට තව වර්ගයක් වෙන් කිරීමට ඉඩ තැබීමට යැයි ද ඔවුහු කියති. දීඝ නිකායේද 13, 10, 11 යනුවෙන් එක සමාන ගණනක් නො වූයේ ද එබැවිනැයි පෙරකී විචාරක මතය යි.

3. සංයුත්ත නිකාය:- පෙරකී දීර්ඝ මධ්‍යම ප්‍රමාණ අනුව සැළකුවොත් මෙහි කෙටි සූත්‍ර ඇතුළත් වියයුතු ය. එම ''කෙටි'' යන නම නැතත්, මෙහි සූත්‍ර නම් කෙටි බවක් පෙනේ. සූත්‍ර 7760 කැයි සුමංගලවිලාසිනී අටුවාවේ එයි. එහෙත් එහි ගාථාවෙක 7762 ක් ගැන කියැවේ. අටුවාව අනුව මෙහි එන සූත්‍ර ''ලෞකික, ලෝකෝත්තර අර්ථයන් ඇසුරු කොට පවත්නා'' ප්‍රශ්නවලට දුන් පිළිතුරු බැවින් ඥානප්‍රභේදය ඇති වීමෙහි ලා ප්‍රයෝජනවත් වෙතැයි පැවැසේ. දීඝනිකායේ සූත්‍ර ශ්‍රද්ධාව දනවීමෙහි ප්‍රයෝජනය සලකා කළ සංග්‍රහයෙකැයි අටුවාව පවසයි. මේ ලක්ෂණ මේවාට ම විශෙෂවූ ඒවා නොවන බැව් අනෙක් නිකායයන් අනුව ද, පෙනෙන බැව් කිවහැකි ය. කෙසේ වෙතත් සංයුත්ත නිකායට එම නමදී ඇත්තේ, එහි පෙනෙන ප්‍රකට ලක්ෂණයවූ සංයුක්ත ක්‍රමය අනුව ය. යම් යම් පුද්ගලයන් හා මාතෘකා යටතේ ඒවාට අයත්වූ කොටස් එක්කොට සංග්‍රහ කොට ඇති බැවිනි. කලින් දක්වූ නිකාය නාමයන් දෙක කෙසේ වුවත්, සංයුක්ත නිකායේ නම් නමට ගැළපෙන අයුරින් සූත්‍ර සංග්‍රහවී ඇතැයි කිවහැකි ය. මෙහි ප්‍රධාන කොටස් පසෙක් වේ. සගාථකවග්ග සංයුක්තය යනාදි විසිනි. එකී පඤ්චවිධ සංයුක්ත යටතේ ම අනෙක් සංයුක්ත බැඳී ඇති බැව් දක්නා ලැබේ. සගාථකවග්ග කොටසට දේවතාසංයුක්තය මුල්කොට ඇති සංයුක්ත 11 ක්ද, නිදානවග්ග කොටසට නිදානසංයුක්තය මුල්කොට ඇති සංයුක්ත 10 ක් ද, ඛන්ධවග්ග කොටසට ඛන්ධ සංයුක්තය මුල්කොට ඇති සංයුත්ත 13 ක් ද, සළායතනවග්ග කොටසට සළායතන සංයුක්තය මුල්කොට ඇති සංයුක්ත 10 ක් ද, මහාවග්ග කොටසට සංයුක්ත 56 ක් ද, ඇතුළත් ය. එහි අවරෝහණ ක්‍රමයකුදු දක්නට ලැබේ. මේ 56 න් 25 ක් පුද්ගලයන් (දේවතා, මාර, භික්ෂු, භික්ෂුණී ආදීන්) පිළිබඳ ව එන සංයුක්තයන්ද, 31 ක් ධර්ම කොටස් (ධාතු, ඉන්ද්‍රිය, බල ආදීන) පිළිබඳ ව එන සංයුක්තයන්ද යනුවෙන් වෙන්වී ඇත. කෙසේ වෙතත් සංයුක්ත නිකායෙහි නිර්මාණය එක්තරා සැලැස්මක් අනුව සකස්වී ඇති බැව් නම් කිව හැකි ය. මෙහි දුර්වල කමක් හෝ අඩුපාඩුවක් ලෙස දක්විය හැකි එක් කරුණක් නම් 10 වැනි භික්ෂුසංයුක්තකයෙහි එනුයේ භික්ෂූන් පිළිබඳ වූ ම කරුණු පමණක් වුවද භික්ෂූන් පිළිබඳ ව දෙසූ කරුණු ඇතුළත් සූත්‍ර අනෙක් රාධ, සාරිපුත්ත, මොග්ගල්ලාන ආදී සංයුක්ත වලද දක්නට ලැබීම යි. නියම ක්‍රමයක් අනුව නම් එකී භික්ෂූන් පිළිබඳ සූත්‍ර ද භික්ෂු සංයුක්තකයට ම ඇතුළත් වියයුතු වෙයි. මෙය දුර්වල කමක් ලෙස ''වින්ටනිට්ස්'' මහතා ද දකියි. මේ හැර ආනාපානසති සංයුක්තය ද සතිපට්ඨාන සංයුක්තය ද එක්වැනි කරුණු පෙනෙන බැවින් එකක්සේ ගැණීමට වුව ද බාධාවක් නැති බැව්ද ඔහු දක්වත්,

4· **අංගුත්තර නිකාය:** සූත්‍ර 9557 ක් යැයි අටුවා අනුව පෙනේ. බණවර 120 කි. අකුරු නවලක්ෂ හැටදහසෙකි. මෙහි නම ලැබී ඇති ක්‍රමය ද ගැළපේ. මෙහි කරුණු එක්තරා සංඛ්‍යා නියමයක් උඩ සංග්‍රහ වී ඇති බැවින් අංගුත්තර යැයි කියවේ. මෙහිදු පෙර කී දීඝ මජ්ඣිම සූත්‍ර නාමයන් අනුව – නාමය ගතහොත් "කෙටිම" සූත්‍රයන් ඇතුළත් වියයුතු ය. එසේ වුව ද මෙහි සූත්‍ර ප්‍රමාණයන්හි දිග, පළල, අඩු, වැඩි, බව සැළකෙනුයේ සංඛ්‍යා නියමයේ ප්‍රමාණය අනුව ය. ඒකක නිපාතයේ සූත්‍ර කෙටිය. ඒකාදස නිපාතයේ සූත්‍ර ඒකක නිපාතයට වඩා දිග ය. මෙහි නම යෙදී ඇත්තේ එක් එක් අංගයකින් ක්‍රමයෙන් වැඩිවීමේ ලක්ෂණය සළකා ගෙන බැව් පෙනේ. එලෙස මෙහි එකක දුක, තික, චතුක්ක ආදී විසින් ඒකාදස නිපාතයක් දක්නට ඇත. එය අංග+ උත්තරක්‍රමය යි. ඒකකනිපාතයෙහි වර්ග 27 කි. සූත්‍ර 668 කි. ශ්‍රාවකශ්‍රාවිකාවන්ගේ යම් යම් කරුණු සම්බන්ධයෙන් දක්වුණු දක්ෂතාව අනුව එතදග්ග පාළියෙහි තැබීම මේ නිපාතයෙහි ඇතුළත් ව ඇත. "ස්ත්‍රී රූපයමෙන් පුරුෂයාගේ සිත මැඩගෙන සිටින අන් එක ද ධර්‍මයක් මම නොදකිමි"යි මුල් සූත්‍රයෙහි එයි. කරුණු වැඩිව ගොස් ඇත්තේ මෙවැනි ධර්‍මයක්, දෙකක්, තුනක්, ආදී විසිනි. දුකනිපාතයේ පණ්ණාසක 3 ක් ද වර්ග 17 ක් ද සූත්‍ර 468 ක් ද ඇතුළත් වේ.

තික නිපාතයේ පණ්ණාසක 3 ක්ද වර්ග 18 ක්ද සූත්‍ර 342 ක්ද ඇතුළත් වේ. චතුක්ක නිපාතයේ පණ්ණාසක 5 ක්ද වර්ග 28 ක්ද සූත්‍ර 782 ක් ද ඇතුළත් වේ. පඤ්චක නිපාතයේ පණ්ණාසක 6 ක්ද වර්ග 26 ක්ද සූත්‍ර ආදී වශයෙන් පණ්ණාසක-වර්ග-සූත්‍ර ආදිය ක්‍රමයෙන් ආරෝහන, අවරෝහන ක්‍රමයට ගතහැකි පිළිවෙළකින් සංග්‍රහ වී ඇතිබැව් පෙනේ. මෙහි සංයුක්ත නිකායේ මෙන් ප්‍රධාන ලක්ෂණය සංයුක්තයන්ට නොගැළපුණත්, එක්තරා සංයුක්ත බවක්ද දක්නට ලැබේ. එනම් කරුණු එක් කොට නම් තැබීමේ පිළිවෙළයි. මේ අනුව සංයුක්ත නිකාය නාමය සූත්‍ර සංග්‍රහය අනුව ද, අංගුත්තර නිකාය නාමය සංඛ්‍යා නියමයක් අනුව ද දීඝ-මජ්ඣිම දෙක පිළිවෙළක් නො දක්නා අයුරින් ද සූත්‍ර හෝ කරුණු හෝ සංග්‍රහ කොට ඇති බැව් පෙනේ. මෙහි සංඛ්‍යා අනුව මිස වෙනත් ක්‍රමයක් නො සලකා ඇති බැව් පෙනේ. විනයට හෝ අභිධර්‍මයට හෝ සම්බන්ධ වූ කරුණු වුවද, "එකක්-දෙකක්" ආදි ලෙස ගත හැකි නම් භේදයක් නො සලකා සංඛ්‍යා ක්‍රමය අනුව ම ඇතුළත් වී තිබේ යැයි කිය හැකිය. මේ සංඛ්‍යා ක්‍රමය දීඝනිකායේ සංගීති – දසුත්තර සූත්‍ර දෙක්හි ද දක්නා ලැබේ. එසේම මෙහි අඩු පාඩු ලෙස සලකතොත් කියහැක්කේ ඒකක නිපාතයේ දී දක්වූ කරුණු ම තවත් නිපාතයක දී එකක් දෙකක් වැඩි කොට ඒවා ම දක් වූ බවයි. සමහරවිට මේ නිසා අවශ්‍ය කරුණු යටපත්වී ගිය හැටි ද පෙනේ. ඒ අනුව චතුක්ක නිපාතයට චතුරාර්‍ය සත්‍යයත් අට්ඨක නිපාතයට ආර්‍ය අෂ්ටාංගික මාර්ගයක් ඇතුළත් විය යුතු ව තිබුණි. එය ද එක්තරා ඌනතාවක් බැව් කිව හැකි ය. මෙහි සූත්‍ර සංග්‍රහයේදී විෂය කරුණු අතින් විවිධතාවක්ද දක්නට ඇත. එනම්, විනය හෝ අභිධර්ම හෝ සූත්‍ර හෝ එක් දෙයක් පමණක් ගෙන නො තිබීම යි. අංගුත්තර කිකායේ එන ඇතැම් දේශනා අන්‍ය නිකායවලද ඇත. දීඝ නිකායේ එන භූමිකම්පන අවස්ථා අට එවැනි තැනෙකි.

කෙසේ වෙතත් දීඝ, මජ්ඣිම නිකාය දෙකට වඩා සැලස්ම අතින් සංයුක්ත – අංගුත්තර දෙක පිළිවෙළක් ඇති ලෙසිනුත් "පණ්ඩිත ප්‍රිය" ලෙසිනුත් සංග්‍රහ වී ඇති බැව් ද ධර්ම කරුණු අතින් සැලකුවොත් නම් සංයුක්ත, අංගුත්තර දෙක ම ඉවත් කළත් සූත්‍ර පිටකයට පාඩුවක් නො වන බැව් ද විචාරක මතය යි. එසේම පශ්චාත් කාලීන කෘතීන් ඇතුළත් ඛුද්දක නිකාය නාමය ද ඊට නොගැළපෙන අයුරු ම සකස් වී ඇති බැව් ද පිළිගණිති.

මේ බටහිර දිග විචාරකයන්ගේ මත මා ඉදිරිපත් කරන ලද්දේ අපේ උගත් භික්ෂූන් වහන්සේලාගේ විචාරය මේ සඳහා නතු වේවායි පතමිනි.